**ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලය -2013**
**-----------------------------------------------**

ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ විස්තීර්ණ ආදායම් ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 1971 අංක 38 දරන මුදල් පනතේ 13 (1) වගන්තිය හා 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 16 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (1) ව්‍යවස්ථාවෙහි ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. මුදල් පනතේ 14 (2) (සී) වගන්තිය ප්‍රකාර මණ්ඩලයේ වාර්ෂික වාර්තාව සමඟ ප්‍රකාශයට පත් කළ යුතු යැයි මා අදහස් කරන මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

**1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම**
**-----------------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොර වූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකිවනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

**1.3 විගණකගේ වගකීම**
**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000-1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදු කරන ලදී. ආචාරධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබාගැනීම පිණිස විගණනය සැලසුම් කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට උපකාරීවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාචෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස මණ්ඩලයේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නා වූ අභ්‍යන්තර පාලනය විගණක සැලකිල්ලට ගන්නා නමුත් මණ්ඩලයේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගැයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගයීමද විගණනයට ඇතුළත් වේ. විගණනයේ විෂය පථය සහ ප්‍රමාණය තීරණය කිරීම සඳහා 1971 අංක 38 දරන මුදල් පනතේ 13 වගන්තියේ (3) සහ (4) උප වගන්තිවලින් විගණකාධිපති වෙත අභිමතානුසාරී බලතල පැවරේ.

මාගේ විගණනය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

**1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

**2. මූල්‍ය ප්‍රකාශන**

**2.1 තත්ත්වාගණනය කළ මතය**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු වලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2013 දෙසැම්බර් 31 දිනට ශ්‍රී ලංකා අපනයන සංවර්ධන මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

**2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම**

**2.2.1 ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 01 අනුව, මූල්‍ය ප්‍රකාශනවල සංසන්දනාත්මක තොරතුරු ඉදිරිපත් කළ යුතු වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ සංසන්දනාත්මක සංඛ්‍යා ඉදිරිපත් කර නොතිබුණි.

(ආ) කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදිකිරීම අරමුණු කොටගෙන මණ්ඩලය හා සංවර්ධන බැංකුවක් සමඟ ඒකාබද්ධ වී සංස්ථාපිත පුද්ගලික සමාගමේ රු.1,439,656,910 ක් වූ රඳවා ගත් ලාභ මත පදනම්ව ආයෝජනයේ ධාරන වටිනාකම වැඩිවීම ලෙස දක්වා තිබූ රු.418,476,859 ක් ගිණුම්ගත කිරීමේදී ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 08 ප්‍රකාර අතීතානුයෝගී නැවත ප්‍රකාශ කිරීම ලෙස ගිණුම් ගත කරනු වෙනුවට පෙර වර්ෂ ගැලපීම් ලෙස සමාලෝචිත වර්ෂයේ සමුච්චිත ලාභයට ගලපා තිබුණි.

(ඇ) ශුන්‍ය ශුද්ධ අගයක් තිබූ සියලුම මෝටර් රථ 2012 දෙසැම්බර් 31 දිනය වන විට ප්‍රත්‍යාගණනය කර තිබුණි. ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 16 අනුව, ක්ෂය ප්‍රතිපාදන අනුපාතය ඵලදායි ජීවිත කාලය මත තීරණය විය යුතු වුවත්, ඊට පටහැනිව ක්ෂය අනුපාත 02 ක් එනම්, අවුරුදු 10 ට වැඩි මෝටර් රථ සඳහා සියයට 20 ක්ද, අවුරුදු 10 ට අඩු මෝටර් රථ සඳහා සියයට 10 ක්ද වශයෙන් ප්‍රත්‍යාගණනයට පෙර පැවති ඵලදායී ජීවිත කාලය පදනම් කරගෙන දක්වා තිබුණි.

(ඈ) මණ්ඩලයට බාහිර පාර්ශවයන්ගෙන් ලැබී තිබූ ප්‍රදානවලින් මිලදී ගත් වත්කම් වෙන් වෙන්ව හඳුනා ගෙන නොතිබුණු අතර ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 20 ප්‍රකාර එම වත්කම්වලට අදාළ ක්ෂය ප්‍රතිපාදනයට සමාන අගයක් ක්‍රමක්ෂය කළ යුතු වුවත් එසේ කර නොතිබුණි.

(ඉ) අපනයනකරුවන්ට දී තිබුණු ණය මත ලැබිය යුතු පොළිය සඳහා ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 36 ප්‍රකාර හානිකරණ ප්‍රතිපාදන සැලසිය යුතු වුවත් මූල්‍ය ප්‍රකාශන තුළින් එවැනි ගිණුම්ගත කිරීමක් සිදු කර නොතිබුණි.

(ඊ) මූල්‍ය ප්‍රකාශනවල ගිණුම් ප්‍රතිපත්ති සටහන් අංක 2.18 මගින් අසම්භාව්‍ය බැරකම් පිළිබඳව දක්වා තිබුණද, 2012 හා 2013 වර්ෂවල ආයතනයට විරුද්ධව හා ආයතනය විසින් පවරා ඇති නඩු 06 ක් සම්බන්ධයෙන් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 37 ප්‍රකාර අසම්භාව්‍ය බැරකම් හා අසම්භාව්‍ය වත්කම් පිළිබඳව මූල්‍ය ප්‍රකාශනවල හෙළිදරව් කර නොතිබුණි.

(උ) වරණීය කොටස් හා සාමාන්‍ය කොටස් ආයෝජනයන්හි අගය හීනවීම වෙනුවෙන් 2012 වර්ෂයේදී වෙන් කළ රු. 122,822,417 ක් වූ අගය 2013 වර්ෂයේදීද වෙන්කිරීම් ලෙස දක්වා තිබුණි. එහෙයින් ශ්‍රී ලංකා ගිණුම්කරණ ප්‍රමිති 39 ප්‍රකාර සමාලෝචිත වර්ෂයට අදාළ ආයෝජනවල හානිකරණය සමාලෝචනය කර නොතිබුණි.

## 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

-----------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2013 දෙසැම්බර් 31 දිනට ලැබිය යුතු අනුග්‍රාහක හා වෙළඳ කුටි ආදායම් රු.3,180,000 ක් මූල්‍ය ප්‍රකාශනවලින් අත් හැරී තිබුණි.

(ආ) නිලධාරියාගේ සේවා කාලය නිවැරදිව ගණනය කර නොතිබීම නිසා සමාලෝචිත වර්ෂයේ පාරිතෝෂික වියදම රු.302,097 කින් වැඩියෙන් දක්වා තිබුණි.

(ඇ) සමාලෝචිත වර්ෂයේදී සහ ඉකුත් වර්ෂවලදී ගෙවා තිබූ එකතුව රු.5,324,516 ක් වූ අත්තිකාරම්වලට අදාළව සේවා හා සැපයුම් නිම කර තිබුණද, තවදුරටත් එම මුදල් අත්තිකාරම් ලෙස දක්වා තිබීමෙන් සමාලෝචිත වර්ෂයේ වියදම එම ප්‍රමාණයෙන් අඩුවෙන් දක්වා තිබුණි.

(ඈ) වගකීම් හා වත්කම් ගිණුම් යටතේ දක්වා තිබූ පිළිවෙලින් එකතුව රු.11,079,248 ක් හා රු.622,595 ක් වූ අසාමාන්‍ය හර හා බැර ශේෂයන් හඳුනා ගෙන නිරවුල් කිරීමට කටයුතු කර නොතිබුණි.

(ඉ) ස්ථාවර වත්කම් විකිණීමෙන් ලද අලාභ රු. 14,952 ක් අඩුවෙන්ද රු.14,952 ක් වූ වත්කම් විකුණුම් වැඩියෙන්ද මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ දක්වා තිබුණි.

(ඊ) මුදල් සහ මුදල් හා සමාන දෑ වලට අයත් නොවූ පෙර වර්ෂ ගැලපීම් රු.418,476,859 ක්, ආශ්‍රිත සමාගමක අගය වැඩිවීම රු.47,862,116 ක් සහ එම ආශ්‍රිත සමාගමේ සමුච්චිත ලාභ ගැළපීම වූ රු.466,338,975 ක් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ මූල්‍ය චලනයට බලපාන පරිදි දක්වා තිබුණි.

(උ) දුරකථන වියදම් රු.43,090 ක්, සංග්‍රහ වියදම් රු.2,020 ක්, වෛද්‍යාධාර වියදම් රු.9,900 ක් සහ නීති වියදම් රු.70,000 ක් වශයෙන් එකතුව රු.125,010 ක් ගොඩනැගිලි කුලී වියදම් වශයෙන් ගිණුම්ගත කර තිබුණු හෙයින් ගොඩනැඟිලි කුලී ගිණුම එම අගයෙන් වැඩියෙන්ද, ඉහත එක් එක් ගිණුම් එම ප්‍රමාණයෙන් අඩුවෙන්ද ගිණුම්ගත කර තිබුණි.

(ඌ) 2013 නොවැම්බර් හා දෙසැම්බර් මාස සඳහා කුරුණෑගල පළාත් කාර්යාලය වෙනුවෙන් වූ ගෙවිය යුතු බදු කුළිය රු. 201,600 ක් උපචිත වියදම් ලෙස දක්වා නොතිබුණි.

(එ) පසුගිය වර්ෂයේ විගණකාධිපති වාර්තාවෙන් පෙන්වා දුන් ප්‍රත්‍යාගණන ලාභය රු.100,000 ක් වැඩියෙන් දැක්වීම, 2013 මූල්‍ය ප්‍රකාශනවල ගලපා නොතිබුණ බැවින් එම අගයෙන් ප්‍රත්‍යාගණන ලාභය සහ දේපල, පිරියත හා උපකරණ වටිනාකම වැඩියෙන් දක්වා තිබුණි.

**2.2.3 නොසැසඳූ පාලන ගිණුම්**

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව 2013 දෙසැම්බර් 31 දිනට අපනයනකරුවන්ගෙන් අයවිය යුතු ශේෂය රු.5,878,112 ක් වුවත් උපලේඛන අනුව එය රු. 4,282,832 ක් වූයෙන් වෙනස රු.1,595,280 ක් විය.

**2.2.4 විගණනය සඳහා සාක්ෂි නොවීම**

පහත සඳහන් ගිණුම් විෂයයන් ඉදිරියෙන් දක්වා ඇති සාක්ෂි ඉදිරිපත් නොවීය.

| ගිණුම් විෂයය | වටිනාකම<br>රු. | ඉදිරිපත් නොකළ සාක්ෂි |
|---|---|---|
| (අ) (i) ආයෝජන | 88,410,377 | කොටස් සහතික |
| (ii) සීඩබ්ලිව්ජී හම්බන්තොට 2018 පුද්ගලික සමාගමේ කොටස්වල කළ ආයෝජන | 8,000,000 | අමාත්‍ය මණ්ඩල අනුමැතිය, මුදල් අමාත්‍යවරයාගේ අනුමැතිය |
| (ආ) නොපියවූ අත්තිකාරම් | 5,324,516 | අත්තිකාරම් ලේඛන, කාල විශ්ලේෂණය |
| (ඇ) ඌව පරණගම අපනයන සැකසුම් ගම්මානය | 10,403,683 | ශේෂ සනාථ කිරීම් සහ විස්තරාත්මක උප ලේඛන |

**2.2.5 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු**

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) මණ්ඩලය, සිය මහනුවර ප්‍රාදේශීය කාර්යාලය පවත්වාගෙන යාම සඳහා රාජ්‍ය බැංකුවක් සතු ගොඩනැගිල්ලක් කල් බදු යටතේ ලබා ගැනීමට 2011 අගෝස්තු 01 දින එකී බැංකුව සමඟ ගිවිසුමකට එළඹ තිබුණි. ගිවිසුම අනුව, බදු ගිවිසුම් කාලය 2013 ජූලි 31 දින අවසන් වී තිබුණ අතර 2014 ජූලි 08 දින වන විටත් නැවත බදු කාලය දීර්ඝ කිරීමක් හෝ නව ගිවිසුමකට එළඹීමකින් තොරව 2013 අගෝස්තු 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා බදු කුලී වශයෙන් රු. 841,000 ක් ගෙවා තිබුණි.

(ආ) ජාතික සවිය වැඩසටහන යටතේ කොළඹ දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ගෙවිය යුතු ලෙස දක්වා තිබූ රු. 1,009,740 ක් එම කාර්යාලයෙන් තහවුරු කර ගැනීමකින් තොරව සහ විධිමත් අනුමැතියකින් තොරව ආදායමට බැර කර තිබුණි.

**2.3 නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම**

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| නීති,රීති, රෙගුලාසි සහ කළමනාකරණ තීරණවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|
| (අ) 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතේ 2 (1) වගන්තිය | අපනයන සංවර්ධන වැඩසටහන් හා ප්‍රතිපත්ති ක්‍රියාත්මක කිරීම සඳහා වූ ජාතික සංවර්ධන සභාව 1992 වර්ෂයේ සිට 2013 වර්ෂය දක්වා වර්ෂ 21 ක කාලයක් ගත වී තිබුණද එකී සභාව පත් කර නොතිබුණි. |
| (ආ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආයතන සංග්‍රහය | |
| XXIV වන පරිච්ඡේදයේ 3.5 වගන්තිය | මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 40 කට වැඩි නොවිය යුතු වුවත් මණ්ඩලයේ කාර්ය මණ්ඩලයට යතුරු පැදි ණය හා ආපදා ණය දීමේදී මාසික අඩු කිරීම්වල එකතුවේ සීමාව මාසික වැටුපෙන් සියයට 50 ක් ලෙස සලකා ලබාදී තිබුණි. |
| (ඇ) ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය | |
| (i) මුදල් රෙගුලාසි 104(1), 104(3), 104(4) සහ 110 | වාහන අනතුරු 06 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර අනතුර සිදුවූ දින සිට මාස 03 ක් ඇතුළත පරීක්ෂණ පවත්වා ඊට වගකිවයුතු නිලධාරීන් හඳුනාගෙන යෝජිත විනයානුකූල ක්‍රියාමාර්ග ඇතුළත් පරිපූර්ණ වාර්තාවක් පරීක්ෂණ කමිටුව විසින් ප්‍රධාන ගණන් දීමේ නිලධාරියාට ඉදිරිපත් කර නොතිබුණ අතර එම අනතුරු පිළිබඳ විස්තර ඇතුළත් හානි ලේඛනයක්ද පවත්වා නොතිබුණි. |
| (ii) මුදල් රෙගුලාසි 165 | ආදායම් සඳහා මුදල්, චෙක්පත් හා අනෙකුත් ලැබීම් භාර ගැනීමේදී බලය පැවරූ නිලධාරියෙකුගේ සහතික කිරීමකින් තොරව ආදායම් එකතු කර තිබුණි. |
| (iii) මුදල් රෙගුලාසි 387 | චෙක්පත් මගින් කෙරෙන සියළුම ගෙවීම් සඳහා මුදල් පොතේ බැංකු ශේෂය ප්‍රමාණවත්දැයි ගෙවන නිලධාරියා සැලකිලිමත් ලෙස පරීක්ෂාකාරී වීමකින් තොරව ගෙවීම් කිරීම නිසා සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනට බැංකු අයිරාව රු.17,148,432 ක් විය. |
| (iv) මුදල් රෙගුලාසි 388 | තැපෑලෙන් යවනු ලබන සියළුම චෙක්පත් පිළිබඳ විස්තර ඇතුළත් කර පවත්වාගෙන යනු ලබන ලේඛනය මුදල් රෙගුලාසි පරිදි විධිමත්ව පිළියෙල කර නොතිබුණි. |

| | | |
|---|---|---|
| | (v) මුදල් රෙගුලාසි 396(ඈ) | චෙක්පතක් නිකුත් කළ දිනය හෝ එය වලංගු කළ දිනය යන දෙකින් පසුව එළඹෙන දින සිට මාස 06 කට වැඩි කාලයක් මුදල් නොකර තිබුණේ නම්, අදාළ ආදායකයාට ලිපි මඟින් සිහිකැඳවීම් කර ඊටද ප්‍රතිචාරයක් නොමැති නම් අදාළ චෙක්පත් අවලංගු කළ යුතු වුවත් 2010 වර්ෂයේ සිට 2013 ජුනි 30 දින දක්වා රු. 1,051,078 ක් වූ ඉදිරිපත් නොකළ චෙක්පත් 45 ක් සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාර කටයුතු කර නොතිබුණි. |
| | (vi) මුදල් රෙගුලාසි 446(2) | ආදායම් හා වියදම් සඳහා බැංකු ජංගම ගිණුම් වෙන් වශයෙන් පවත්වා ගෙන යනු ලබන විට ශේෂ තුලනය කර ඉතිරි මුදල් ශේෂය ගණනය කිරීම සඳහා සාරාංශ ප්‍රධාන මුදල් පොත පවත්වාගත යුතු වුවත් එසේ පවත්වා නොතිබුණි. |
| | (vii) මුදල් රෙගුලාසි 1645 හා 1646 | මණ්ඩලය සතු වාහන 28 කට අදාළව වාහන ලොග් සටහන් පොත්, දෛනික ධාවන සටහන් සහ මාසික සාරාංශ අදාළ මාසය අවසන් වී ඊලඟ මාසයේ 15 වෙනි දිනට පෙර විගණනයට ඉදිරිපත් කර නොතිබුණි. |
| | (viii) මුදල් රෙගුලාසි 1647(ඉ) | වාහන ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඈ) | 1978 දෙසැම්බර් 19 දිනැති අංක 842 දරන භාණ්ඩාගාර චක්‍රලේඛයේ 03 වගන්තිය | ස්ථාවර වත්කම් ලේඛනයක් නඩත්තු කර නොතිබුණි. |
| (ඉ) | 2002 නොවැම්බර් 28 දිනැති අංක අයිඒඅයි/2002/02 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය | පරිගණක හා පරිගණක උපාංග වෙනුවෙන් වෙනම වත්කම් ලේඛනයක් පැවැත්විය යුතු වුවද, වටිනාකම රු.31,688,112 ක් වූ පරිගණක හා උපාංග වෙනුවෙන් එවැනි ලේඛනයක් පවත්වා නොතිබුණි. |
| (ඊ) | 2009 දෙසැම්බර් 09 දිනැති අංක 441 රාජ්‍ය මුදල් චක්‍රලේඛය හා මුදල් රෙගුලාසි 756 හා 757 | නියමිත දින වකවානු තුළ මුදල් රෙගුලාසි විධිවිධාන පරිදි භාණ්ඩ සමීක්ෂණ සිදු කර වාර්තාවක් විගණකාධිපතිවරයා වෙත ඉදිරිපත් කිරීමට කටයුතු කර නොතිබුණි. |
| (උ) | 2010 දෙසැම්බර් 07 දිනැති අංක 150 දරන ජාතික අයවැය චක්‍රලේඛය | මණ්ඩලයට අවශ්‍ය වාහන මූල්‍ය කල්බදු ක්‍රමය යටතේ ලබාගත යුතු වුවද, ඊට පටහැනිව වර්ෂ 05 ක කාලයක් සඳහා බදු කුළී පදනම මත වාහන 04 ක් ලබාගෙන 2013 දෙසැම්බර් 31 දින වන විට රු.10,051,179 ක් බදු කුළී වශයෙන් ගෙවා තිබුණි. |

| | |
|---|---|
| (ඖ) 1994 ජුනි 14 දිනැති අංක 95 දරන රාජ්‍ය ව්‍යාපාර දෙපාර්තමේන්තු චක්‍රලේඛයේ 02 වගන්තිය | චක්‍රලේඛ විධිවිධානවලට පටහැනිව මණ්ඩලය විසින් නියෝජ්‍ය අධ්‍යක්ෂවරුන්ට මාසිකව රු.5,500 ක ප්‍රවාහන දීමනාවක්ද, අනෙකුත් සේවකයින්ට දෛනිකව රු.164 ක උපරිමයකට යටත්ව ප්‍රවාහන දීමනාවක් ද ගෙවා තිබුණි. ඒ අනුව සමාලෝචිත වර්ෂයේදී චක්‍රලේඛයට පටහැනිව ගෙවා තිබූ මුළු ප්‍රවාහන දීමනාව රු.5,004,963 ක් විය. |
| (එ) 2003 ජුනි 02 දිනැති අංක පීඊඩී/12 දරන යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ | |
| (i) 5.2.3 ඡේදය | අයවැය ලේඛනය ඉදිරිපත් කිරීමේදී 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අයවැයගත ආදායම් හා වියදම් ප්‍රකාශනය හා මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සහ එදිනට අයවැයගත ශේෂ පත්‍රයක් සමාලෝචිත වර්ෂය සඳහා ඉදිරිපත් කර නොතිබුණි. |
| (ii) 8.3.9 ඡේදය | මණ්ඩලයට අයත් වාහන 05 ක් සහ නිලධාරීන් 05 දෙනෙකු රේඛීය අමාත්‍යාංශයේ සේවයට යොදවා තිබුණි. 2013 වර්ෂයේදී වාහන නඩත්තු වියදම් සහ කාර්ය මණ්ඩල වැටුප් හා දීමනා ලෙස පිළිවෙලින් රු.3,204,138 ක් හා රු.899,195 ක් වශයෙන් එකතුව රු.4,103,333 ක් මණ්ඩලයේ අරමුදලින් වැයකර තිබුණි. |

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව, 2013 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා මණ්ඩලයේ මෙහෙයුම් කටයුතුවල මූල්‍ය ප්‍රතිඵලය රු.100,514,844 ක අතිරික්තයක් වූ අතර ඊට ප්‍රතිරූපීව ඉකුත් වර්ෂයේ ඌනතාවය රු.60,305,699 ක් විය. ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයේ රු.160,820,543 ක වාසිදායක වර්ධනයක් නිරීක්ෂණය වූ අතර එම වර්ධනය කෙරෙහි මුළු ආදායම් ලැබීම් රු.69,380,831 කින් වැඩි වීම හා මුළු වියදම් රු.91,439,712 කින් අඩුවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4. මෙහෙයුම් සමාලෝචනය**

**4.1 කාර්යසාධනය**

**(අ) අපනයන ප්‍රවර්ධන සහ සංවර්ධන වැඩසටහන්**

| අංශය | භෞතික කාර්යසාධනය | | | | | මූල්‍ය කාර්යසාධනය | | |
|---|---|---|---|---|---|---|---|---|
| | ඉලක්කගත වැඩසටහන් ගණන | අවලංගු කළ හෝ අත්හිට වූ වැඩසටහන් ගණන | ප්‍රමාණවත් පරිදි සම්පූර්ණ නොකළ වැඩසටහන් ගණන | සම්පූර්ණ කළ වැඩසටහන් ගණන | කාර්ය සාධන ප්‍රතිශතය | අයවැයගත ප්‍රතිපාදනය | තථ්‍ය මූල්‍ය උපයෝජනය | උපයෝජනයේ ප්‍රතිශතය |
| | | | | | සියයට | රු.මිලියන | රු.මිලියන | |
| කාර්මික නිෂ්පාදන | 43 | 05 | 08 | 30 | 70 | 61.23 | 23.51 | 38 |
| කෘෂිකර්ම හා ධීවර නිෂ්පාදනය | 39 | 04 | 14 | 21 | 54 | 53.78 | 31.86 | 59 |
| අපනයන සේවා | 20 | 02 | 07 | 11 | 55 | 29.33 | 3.72 | 13 |
| අලෙවි සංවර්ධන | 42 | 01 | 07 | 34 | 81 | 64.98 | 40.48 | 62 |
| ප්‍රාදේශීය සංවර්ධන | 30 | 02 | 14 | 14 | 47 | 71.06 | 28.46 | 40 |
| අනෙකුත් අපනයන සේවා | 27 | - | 04 | 23 | 85 | 29.28 | 10.85 | 37 |
| විශේෂ ව්‍යාපෘති | 11 | 04 | 06 | 01 | 9 | 79.86 | 3.80 | 4.8 |
| අනෙකුත් | 02 | - | 02 | - | 0 | 115 | ඉදිරිපත් කර නොතිබුණි | 0 |
| **එකතුව** | **214** | **18** | **62** | **134** | **62** | **505.02** | **142.68** | **28** |

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) මණ්ඩලයේ ක්‍රියාකාරී සැලැස්ම අනුව ක්‍රියාත්මක කිරීමට ඉලක්ක කර තිබුණු වැඩසටහන් සංඛ්‍යාව 214 ක් වූ අතර ඉන් සම්පූර්ණ කර තිබුණේ වැඩසටහන් 134 ක් පමණි. ඒ අනුව භෞතික කාර්යසාධනයේ ප්‍රගතිය සියයට 62 ක් විය. මෙම වැඩසටහන සඳහා රු.මිලියන 505.02 ක් ප්‍රතිපාදනය කර තිබුණු අතර ඉන් උපයෝජනය වී තිබුණේ රු.මිලියන 142.68 ක් හෙවත් සියයට 28 ක් පමණි.

(ii) ඉදිරිපත් කර තිබුණු කාර්යසාධන වාර්තා අනුව, ඉලක්කගත වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ හේතු හඳුනා ගෙන නොතිබුණු අතර වැඩසටහන් කිහිපයකට ප්‍රමාණවත් මුදල් ප්‍රතිපාදනය නොකිරීම නිසා ක්‍රියාත්මක කර නොතිබුණි. මෙම වැඩසටහන් ක්‍රියාත්මක නොකිරීමට බලපෑ හේතු හඳුනා ගෙන නොතිබීමෙන් එම වැඩසටහන් නැවත ක්‍රියාත්මක කරනවාද නැද්ද යන්න පිළිබඳ පසුවිපරම් කර නොතිබුණි.

(ආ) විදේශ වෙළඳ ප්‍රදර්ශන

-------------------------

අපනයන ප්‍රවර්ධන වැඩසටහන් යටතේ 2008-2013 කාලපරිච්ඡේදය තුළදී විදේශ වෙළඳ ප්‍රදර්ශන 04 ක් සඳහා අපනයනකරුවන් 82 දෙනෙකු සහභාගි කරවා රු. මිලියන 65.38 ක් වැයකර තිබුණද අපනයන ප්‍රවර්ධනයට ඔවුන්ගෙන් දායක වී තිබුණේ අපනයනකරුවන් 25 දෙනෙකු පමණි. මේ අනුව අපනයන ආදායම වර්ධනය කිරීමෙහිලා, විදේශ වෙළඳපල ප්‍රදර්ශන සඳහා අපනයනකරුවන් සහභාගි කරවීම ඵලදායී අන්දමින් සිදු වී නොතිබුණි.

(ඇ) පාඨමාලා ප්‍රගතිය

--------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(i) 2009-2011 කාලපරිච්ඡේදය තුළදී ජාත්‍යන්තර වෙළඳාම් ක්‍රියාකාරී අංශ පිළිබඳ පාඨමාලාව හදාරන ලද ප්‍රමාණය ක්‍රමයෙන් අඩුවෙමින් පැවතියත් 2012 වර්ෂයේදී එම ප්‍රමාණය වැඩි වී තිබුණි. එසේ වුවත් 2009 වර්ෂයට සාපේක්ෂව 2012 වර්ෂයේදී සියයට 32 ක පිරිහීමක් සිදු වී තිබුණි. 2009 වර්ෂයේදී පාඨමාලා පැවත්වූ වාර ගණන 04 ක් වූ අතර 2013 වන විට එය එක් පාඨමාලාවක් දක්වා අඩු වී තිබුණි.

(ii) ඇඟළුම් ක්ෂේත්‍රයේ සේවයේ නියැලී සිටින කාර්යය මණ්ඩලයට පුහුණු වැඩසටහන් පැවැත්වීම වෙනුවෙන් ලැබී තිබුණු පුහුණු වැඩසටහන් ආදායම රු. 207,500 ක් වුවද, ඒ සඳහා රු. මිලියන 1.04 ක් වැය කර තිබුණි.

4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා

------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 2012 වර්ෂයේදී රු. මිලියන 156.6 ක් වැය කරමින් පැවත්වූ ශ්‍රී ලංකා එක්ස්පෝ ජාත්‍යන්තර වෙළඳ ප්‍රදර්ශනයේ ඉලක්ක හා අරමුණු ඉටු කර ගැනීමට හැකියාවක් තිබේද යන්න, පෙර වෙළඳපල නිරීක්ෂණයන් මඟින් තහවුරු කර ගෙන නොතිබුණ අතර ප්‍රදර්ශනය පැවැත්වීමෙන් අනතුරුවද ප්‍රදර්ශනය පැවැත්වීමේ අරමුණු හා ඉලක්ක සාක්ෂාත් කර ගැනීමට හැකිවූයේද යන්න පිළිබඳ ඇගයීමක් හෝ සමාලෝචනයක් 2013 වර්ෂයේදී කර නොතිබුණි.

(ආ) අම්පාර කෘෂි අපනයන නිෂ්පාදන කලාපයට රු. මිලියන 09 ක් වූ අන්නාසි මොරෙයියන් මිලියන 1.2 ක් සපයා ගැනීමට 2009 නොවැම්බර් 18 දින සැපයුම්කරුවකු සමඟ එළඹී ගිවිසුම අනුව, සියයට 50 ක අත්තිකාරම් මුදලක් සපයා තිබුණ අතර 2010 පෙබරවාරි 25 දින වන විට අන්නාසි මොරෙයියන් 86,250 ක් පමණක් සපයා තිබූ බැවින් ව්‍යාපෘති කටයුතු අඩාල වී තිබුණි. ඒ අනුව අදාළ ව්‍යාපෘතියේ අරමුණු ඉටු වී නොතිබුණ අතර අත්තිකාරම් මුදලින් රු. 3,853,350 ක් 2013 දෙසැම්බර් 31 දින වන විටත් අය කර ගෙන නොතිබුණි. එසේම එහි වර්තමාන තත්ත්වය පිළිබඳව පසු විපරම් කටයුතු සිදු කර නොතිබුණි.

(ඇ) ණය ලබා දී තිබුණු අපනයන සමාගම් 166 කින් සමාගම් 23 කට පමණක් එරෙහිව නෛතික ක්‍රියාමාර්ග ගැනීමෙන් අනතුරුව රු. 6,996,307 ක් වූ හිඟ ණය ශේෂයෙන් 2006 ජනවාරි 01 දින සිට 2013 දෙසැම්බර් 31 දක්වා කාලපරිච්ඡේදය තුළදී අයකර ගෙන තිබුණේ රු. 2,801,711 ක් පමණි. 2007 වර්ෂයෙන් පසු නෛතික ක්‍රියාමාර්ග මඟින් ණය අයකර ගැනීම පිළිබඳ පසු විපරම් කටයුතු ඉටු නොකිරීම නිසා, ණය අය වෙමින් පැවති අපනයන සමාගම් 23 න් 16 ක් ණය ගෙවීම පැහැර හැර තිබුණි. ඉතිරි සමාගම් අතරින් ණය ආපසු ගෙවීම පැහැර හරින ලද අපනයන සමාගම් 130 කින් අයවිය යුතු රු. 32,966,208 ක් වූ ණය අය කර ගැනීම සඳහා 2014 ජුනි 30 වන විටත් නෛතික ක්‍රියාමාර්ග ගෙන නොතිබුණි.

(ඈ) කාර්යාල ගොඩනැගිලි සංකීර්ණය ඉදි කිරීම අරමුණු කොටගෙන මණ්ඩලය, සංවර්ධන බැංකුවක් සමඟ ඒකාබද්ධව පෞද්ගලික සමාගමක් 1993 නොවැම්බර් 18 දින සංස්ථාපනය කර තිබුණි. මණ්ඩලය විසින් අදාළ සමාගමේ කොටස්වල කළ ආයෝජනය රු.161,088,760 ක් වූ අතර එය එම සමාගමේ මුළු කොටස් ස්කන්ධයෙන් සියයට 41.39 ක් විය. එසේ වුවද, 1996-2006 කාලපරිච්ඡේදය තුළදී ලාභාංශ ගෙවීමට ප්‍රමාණවත් ලාභ අදාළ සමාගම උපයාගෙන තිබුණද ආයෝජන සඳහා ප්‍රතිලාභ මණ්ඩලයට ලබා දී නොතිබුණි.

(ඉ) සමාගම් 30 ක වරණීය කොටස්හි කළ රු. 105,058,084 ක් වූ ආයෝජන සඳහා 1997–2013 කාලපරිච්ඡේදයට සහ සමාගම් 31 ක සාමාන්‍ය කොටස්වල කළ රු.43,494,334 ක් වූ ආයෝජන සඳහා 2001-2013 කාලපරිච්ඡේදයට අදාළව ලාභාංශ ලැබී නොතිබුණි.

(ඊ) ඉන්දියාවේ චෙන්නායි නුවර 2004-2009 කාලපරිච්ඡේදය තුළ මණ්ඩලය විසින් පවත්වාගෙන යනු ලැබූ ශ්‍රී ලංකා වෙළඳ මධ්‍යස්ථානයේ වෙළඳසැල් 05 කින් අය විය යුතු හිඟ කුලී හා විදුලි ගාස්තු රු.7,049,858 ක් 2014 ජුනි 30 වන විටත් අය කර ගෙන නොතිබුණි.

(උ) අපනයන සමාගම්වල මූල්‍ය ශක්තිය වැඩි දියුණු කර අපනයන වර්ධනය තුළින් ඉහළ අපනයන ආදායමක් ලබා ගැනීමේ අරමුණ ඇතිව 1983-1999 කාලපරිච්ඡේදය තුළ ආරම්භ කළ ණය වැඩසටහනක් යටතේ අපනයන සමාගම් 331 කට ණය ලබාදී තිබුණි. එයින් සමාගම් 166 ක් සඳහා ලබා දී තිබූ රු.59,659,978 ක් වූ ණය මුදලින් රු.46,413,543 ක් අය කරගෙන නොතිබුණි.

**4.3 මතභේදයට තුඩු දෙන ගණුදෙනු**

---------------------------------------

පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) 1979 අංක 40 දරන ශ්‍රී ලංකා අපනයන සංවර්ධන පනතේ 12 වගන්තියේ දැක්වෙන මණ්ඩලයේ කාර්යයන්වලින් බැහැරව හා අංක පීඊඩී 12 හා 2003 ජුනි 02 දිනැති යහපාලනය පිළිබඳ රාජ්‍ය ව්‍යාපාර චක්‍රලේඛයේ 8.2.3 ඡේදය ප්‍රකාර මුදල් අමාත්‍යවරයාගේ පූර්ව අනුමැතිය ලබා ගැනීමකින් තොරව 2018 පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලබා ගැනීමේ කටයුතු සංවිධානය, ක්‍රීඩා කටයුතු සංවර්ධනය හා ප්‍රවර්ධනය උදෙසා 2011 වර්ෂයේ පිහිටුවා තිබුණු එක්

පෞද්ගලික සමාගමක කොටස් මිලදී ගැනීම වෙනුවෙන් රු. මිලියන 8 ක් ආයෝජනය කර තිබුණි. කෙසේ වෙතත්, පොදු රාජ්‍ය මණ්ඩලීය ක්‍රීඩා උළෙලේ සත්කාරකත්වය ලංකාවට නොලැබීම මත 2013 දෙසැම්බර් 31 දින වනවිටත් මෙම සමාගමේ කටයුතු අක්‍රීය වී තිබුණි.

(ආ) පුහුණු කටයුතු සඳහා මණ්ඩලයේ ඉඩ පහසුකම් තිබියදීත්, එය නොසලකා අයදුම්කරුවන් 45 කට ආසන්න සංඛ්‍යාවක් සහභාගි වූ එක් පාඨමාලාවක් බාහිර ආයතනයක පැවැත්වීම වෙනුවෙන් 2011– 2013 කාල පරිච්ඡේදය තුළදී රු.602,274 ක් වැය කර තිබුණි.

## 4.4 කාර්ය මණ්ඩල පරිපාලනය

මණ්ඩලයේ 2013 දෙසැම්බර් 31 දිනට අනුමත හා තථ්‍ය කාර්ය මණ්ඩලය පිළිබඳ තත්ත්වය පහත පරිදි විය.

| සේවක මණ්ඩල වර්ගීකරණය | අනුමත සංඛ්‍යාව | තථ්‍ය සංඛ්‍යාව | පුරප්පාඩු සංඛ්‍යාව |
|---|---|---|---|
| තෘතීයික | 65 | 54 | 11 |
| ද්විතීයික | 128 | 85 | 43 |
| ප්‍රාථමික | 75 | 61 | 14 |
| කොන්ත්‍රාත් | -- | 13 | -- |
| එකතුව | 268 | 213 | 68 |

මේ සම්බන්ධයෙන් පහත සඳහන් නිරීක්ෂණ කරනු ලැබේ.

(අ) කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල් විසින් කර්මාන්ත හා වාණිජ කටයුතු අමාත්‍යාංශයේ ලේකම් අමතන ලද 2010 අගෝස්තු 13 දිනැති අංක ඩීඑම්එස්/ඊ4/30/4/200/2 දරන ලිපියේ 11 ඡේදය අනුව, තනතුරු පුරප්පාඩු පිරවීම සඳහා කළමනාකරණ සේවා දෙපාර්තමේන්තුවේ අනුමැතිය ලබා ගත යුතු වුවත් ඒ අනුව කටයුතු කර නොතිබුණි.

(ආ) ආයතන සංග්‍රහයේ II පරිච්ඡේදයේ 6.1.5 වගන්තිය ප්‍රකාරව, සහකාර අධ්‍යක්ෂ (සාමාන්‍ය), සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත් කළමනාකරණ), සහකාර අධ්‍යක්ෂ (පරිපාලන) සහ සහකාර අධ්‍යක්ෂ (මුදල්) යන තනතුරු සඳහා වූ බඳවාගැනීම් හා උසස් කිරීම් අනුමත බඳවා ගැනීම් පරිපාටියකින් තොරව සිදු කර තිබුණි.

(ඇ) බඳවා ගැනීමේ පරිපාටිය අනුව, අදාළ තනතුරට අධ්‍යාපන සුදුසුකම් හා සේවා පළපුරුද්ද සැලකිල්ලට ගත යුතු වුවත් එම සුදුසුකම් සපුරා නොතිබූ නිලධාරියෙකු සහකාර අධ්‍යක්ෂ (මානව සම්පත්) තනතුර සඳහා බඳවා ගෙන තිබුණි.

(ඈ) 2006 සැප්තැම්බර් 22 දිනැති අංක 30 දරන කළමනාකරණ සේවා චක්‍රලේඛය ප්‍රකාර විධිමත් අනුමැතියකින් තොරව කොන්ත්‍රාත් පදනම මත නිලධාරීන් 13 දෙනෙකු බඳවා ගෙන වැටුප් හා දීමනා වශයෙන් රු. 5,420,465 ක් සමාලෝචිත වර්ෂයේදී ගෙවා තිබුණි.

**5. ගිණුම් කටයුතුභාවය සහ යහපාලනය**

**5.1 අභ්‍යන්තර විගණනය**

2009 ජූනි 09 දිනැති අංක ඩීඑම්ජී/2009/(1) දරන කළමනාකරණ විගණන චක්‍රලේඛයේ වගන්ති 07 සහ 09 අනුව අභ්‍යන්තර විගණන වැඩසටහන් සහ විගණන සැලැස්ම සකස් කර නොතිබුණ අතර, විගණන කටයුතු ක්‍රියාත්මක කිරීම දුර්වල තත්ත්වයක පැවතිණි. කෙසේ වෙතත්, සමාලෝචිත වර්ෂයේදී විගණන විමසුම් 04 ක් නිකුත් කර තිබුණද එම විමසුම්වලින් වාර්තා කර තිබුණු අඩුපාඩු සම්බන්ධයෙන් ද මණ්ඩලයේ අවධානය යොමුකර නිවැරදි කර ගැනීමට කටයුතු කර නොතිබුණි.

**5.2 අයවැය ලේඛනමය පාලනය**

අයවැයගත වියදම් සහ තථ්‍ය වියදම් අතර සැලකිය යුතු විචලනයන් නිරීක්ෂණය වූයෙන් අයවැය ලේඛනය ඵලදායී කළමනාකරණ පාලන කාරකයක් ලෙස උපයෝගී කරගෙන නොතිබුණු බව නිරීක්ෂණය විය.

**5.3 නොවිසඳී ඇති විගණන ඡේද**

පසුගිය විගණන වාර්තාවෙන් පෙන්වා දී ඇති නමුත්, ප්‍රමාණවත් අවධානයක් යොමු කර නොතිබුණු විගණන ඡේද පහත දැක්වේ.

| **2012 වර්ෂයේ විගණන ඡේදයට යොමුව** | **විගණන ඡේදයේ සාරාංශය** |
|---|---|
| 2.2.6 ප්‍රමාණවත් අධිකාර බලයකින් තහවුරු නොවූ ගනුදෙනු | 1979 අංක 40 දරන අපනයන සංවර්ධන පනතට පටහැනිව පත් කර තිබූ විධායක අධ්‍යක්ෂවරයෙකුට 2012 දෙසැම්බර් 31 දිනට මාසික දීමනා, ඉන්ධන දීමනා හා දුරකථන ගාස්තු වශයෙන් එකතුව රු. 1,557,337 ක් මණ්ඩලයේ අරමුදලින් ගෙවා තිබුණි. |
| 4.2 කළමනාකරණ අකාර්යක්ෂමතා (ඇ) | ඌව පරණගම හරිතාගාර ව්‍යාපෘතිය යටතේ ගිවිසුම් ගත කොන්දේසි පරිදි හරිතාගාර 100 ඉදිකිරීම සඳහා ඌව පරණගම ගොවීන්ට ගෙවූ රු.මිලියන 5 ක් වූ ණය මුදල් ගොවීන්ගෙන් ආපසු අයකර ගෙන මහා භාණ්ඩාගාරයට ගෙවීමේ වගකීම මණ්ඩලයට පැවරී තිබුණද එම වගකීම මණ්ඩලය ඉටුකර නොතිබුණි. |
| 4.3 හඳුනාගත් පාඩු | හම්බන්තොට බටඅත කර්මාන්ත වැඩසටහනේ සම්භාණ්ඩ කර්මාන්ත ව්‍යාපෘතිය සඳහා රු. 1,000,000 ක් ආයෝජනය කර ස්ථාපිත කළ පුද්ගලික සමාගමේ කටයුතු ආරම්භ කිරීම අත්හැර දමා තිබුණු බැවින්, ආයෝජනය කළ මුදල් මණ්ඩලයට අය කර ගැනීමට කටයුතු කර නොතිබුණි. |

**6. පද්ධති හා පාලන**

---------------------

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු පිළිබඳව වරින් වර මණ්ඩලයේ සභාපතිවරයාගේ අවධානයට යොමු කරන ලදී. පහත සඳහන් පාලන ක්ෂේත්‍රයන් සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කළ යුතු වේ .

(අ) අයවැය ලේඛනය
(ආ) ගිණුම්කරණය
(ඇ) ආයෝජන
(ඈ) ණය ආපසු අයකර ගැනීම
(ඉ) වත්කම් කළමනාකරණය
(ඊ) වෙළඳ ප්‍රදර්ශන